පෙබරවාරි මාසයේ ඔබේ නිවසට
ධන යෝග 3 ක්, අධ්‍යාපන යෝග 3 ක් එනවා

එම යෝග අල්ලාගෙන වාසනාව ගන්න ආකාරය මම උගන්වනවා
2015 ට අලුත්ම ෆෙංෂුයි රහස් ආසිරි වනිගරත්න වැඩමුළුව
ලංකාවේ නගර 22 ක සහ ඕස්ට්‍රේලියාවේ මෙල්බන් නගරයේදී
පෙබරවාරි 22 ඉරිදා උදේ 9.30ට

2015 සෑම නිවසකටම එන ෆෙංෂුයි යෝග

1. MONEY STAR අධික ධන වාසනාව
2. SECONDARY MONEY STAR දෙවැනි ධන යෝගය
3. MISFORTUNE STAR අවාසනාවන්න යෝගය
4. SICKNESS STAR අසනීප යෝගය
5. ARGUMENT STAR ගැටුම් ඇතිකරන දිශාව
6. ACADEMIC STAR අධ්‍යාපන යෝගය
7. ROMANCE STAR ආදරය/ආලයට බලපාන දිශාව
8. HEAVEN STAR දිව්‍යලෝක වාසනාව
9. ROBBERY STAR සොරකම් සහ ගැටුම් යෝගය

මෙම ඉහ යෝගවලින් ප්‍රයෝජන ගන්නා ආකාරයක්, අඳහ යෝග පාලනය කරගන්නා ආකාරයක් මෙම වැඩමුළුවේදී උගන්වනවා.

2015 වසර අපේ වන්නේ ඔටවවා වින ලග්නයටයි. ඔටවවාගේ වසර තුළදී වගම් 2015 සෙප්තැම්බර් 19 සිට 2016 සෙප්තැම්බර් 7 දක්වා ඔබේ සහ ඔබේ නිවසේ වාසනාව දෙදහන තෙදහන කරගන්නා ආකාරය මේ වැඩමුළුවේදී උගන්වනවා.

2006 වසරේදී මුල්වරට පැවැත්වූ මෙම වැඩමුළුව සෑම වසරකම පැවැත්වුවා. මෙවර පවත්වන්නේ 10 වෙනි වසරයි.

මේක ජාත්‍යන්තර වැඩමුළුවක්

මේ වැඩමුළුව ලොව සෑම දියුණු රටකම ජනවාරි, පෙබරවාරි මාසවල පැවැත්වෙනවා. ඕස්ට්‍රේලියාවේ ඉන්න ෆෙංෂුයි උපදේශකවරු විශිෂ්ඨ මෙම වැඩමුළුව පවත්වනවා.

අපේ ගෙදරට කරන රකින්

2015 වසරේදී අපේ ගෙදරට කරන අලුත් ෆෙංෂුයි රහස් පියල්ල මම සම්පූර්ණ කෙළිකරනවා. (කියලා දෙනවා). මොකද අවුරුදු පහ තිස්සේ වාසනාව විකක් වෙනස් වෙනවානේ. ඒවා කමක් දැක්කෙත ඒ අලුත් අලුත් ෆෙංෂුයි රහස් හොලොකෙන අපේ වාසනාව කිසිත ඉණසකින් වැඩි කරගන්න පුළුවන්.

ඔබේ පැතුමක් ඉටුකරන ෆෙංෂුයි ප්‍රාර්ථනා පත්‍රය
(ඔබේ ලොකුම බලාපොරොත්තුව 2015 දී ඉටුකර ගන්න)

ඕස්ට්‍රේලියාවේ මෙම බලසම්පන්න ප්‍රාර්ථනා පත්‍රය මා ලබාදුන්නේ 2009 වැඩමුළුවේදී. ඔබේ යම්කිසි ප්‍රාර්ථනාවක් මේ ගුප්ත මන්තර කොළයේ ලියලා ක්‍රියා කරයියා දෙන ඔලාගෙන එම කොළය හවලා මෙය සඟවා තබාගත යුතුයි. ඒ සියල්ල මම වැඩමුළුවේදී උගන්වනවා. මෙම ක්‍රමය කොයිතරම් සාර්ථකද කියනවා නම් අපේ සෑම වැඩමුළුවකදීම අපි මේ ගුප්ත පත්‍රිකාව නොමිලේ දෙනවා. මෙහි වටිනාකම මිල කරන්න බැහැද. ඒත් ඔබට නොමිලේ!

ගැඹුරු චීන ජ්‍යොතිෂයෙන් ඔබට 2015 පලාඵල

ඔබේ උපන් වෙලාව ලියාගෙන එන්න. මම ඔබට ඒ අනුව විනාඩි 10 න් චීන ක්‍රමයට කෙටි කේන්ද්‍රයක් හදාගන්නා ආකාරය උගන්වනවා. ඊටපසුව ඔබේ කේන්ද්‍රයට 2015 ඔබට පලාඵල විස්තරය මම දෙනවා. මේ පාඩම් මාලාව ගිය වසරේ වැඩමුළුවේ ජනප්‍රියම අංශය වුණා.

මෙල්බන් - වැඩමුළුව

පෙබරවාරි 22 ඉරිදා උදේ 9.30 ට. අයකිරීම ඩොලර් 25 ක් පමණයි. මෙල්බන් වැඩමුළුවට සහභාගී වීමට කැමති අය කලින්ම ඒ බව දැනුම් දිය යුතුයි. S.M.S පණිවිඩයකින් හෝ ඊ-මේල් එකකින් අදම දන්වන්න. (ආසන සීමිතයි).

Location - Old Shire Offices, No.60, Beverly Road, Heidelberg
DINESH - 044-9281003 / asirimelb@gmail.com

Web - www.fengshuilanka.com
Face book - asiriwanigaratne.fengshuicollection

මෙල්බන් වැඩ මුළුව - වැඩි විස්තර සඳහා දිනේෂ් 0449 281 003

කුමාර් ගුණරත්නම් ඇතුලු පිටුවහල් කළ සියලු දෙනාගේ දේශපාලන අයිතිය උදුරා නොගනිව්!

පෙරටුගාමී සමාජවාදී පක්ෂය
41/32, කැන්දහේනවත්ත, දෙපානම, පන්නිපිටිය
0112837422 www.flsocialistparty.com flsplanka@gmail.com

කැස්ස - Cough

Upper Respiratory system හෙවත් නාසයේ සිට පෙනහලු තෙක් විහිදෙන ශ්වසන පද්ධතියේ ඇති වන ප්‍රධාන රෝග ලක්ෂනයක් වනුයේ කැස්ස ය. කැස්ස ඇතිවන්නේ අභිවානු ගත පේෂීන්ගේ ක්‍රියාවක්, මස්තිෂ්කයේ බලපෑමක් මගින් සෙම ආදී අනවශ්‍ය පදාර්ථ ඉවත් කර දැමීම සඳහා ඇතිවන ක්‍රියාවලියේ දිය.

උත්කාශය යනු සෙම ගැලවී යන කැස්ස ඇති විට ශ්වසන නාලය තුළ සෙම ගලා යන විටයි. මෙය තීව්‍ර අවස්ථාවකි (Chronic Bronchitis). කලක් පවතින මෙම ප්‍රදාහ අවස්ථාව නිසා පුප්පුස රෝග හා වෘක්ක රෝග ආදී රෝගයන්ගේ උපද්‍රවයක් ලෙස මෙය පැවතිය හැකිය.

වාතජ, පිත්තජ, කඵජ, ක්ෂයජ හා ක්ෂතජ යන කාස පංච විධය. වාතජ කාසය නිසා හටගන්නා කැස්ස හඬ බිඳී වියලී යයි. පිත්තජ කාසය ඇතැම් විටක පිත ධමනය කරයි. කැස්ස කටුක වන අතර දැවිලි සහිත පඩු පැහැති සෙම පිටකරයි. කඵජ කැස්ස ඇතිවන්නේ පමණට වඩා ශ්‍රමය වයස කිරීම, බර ඉසිලීම හා ගිතර පිධිත වීම නිසා, සිත, කය පීඩා කරන හේතු වලින් කිපුනා වූ වාතය මගින් පෙනහළු වල ක-ඩා ගර්ත වල ආසාදනය ඇති කිරීම නිසා උපදින කැස්සයි. ක්ෂයජ කාසය තුන් දොස් කිරීම හේතුවෙන් ධාතු ක්ෂය වීමෙන් ඇති වේ.

රෝගියාගේ වයස ආසාදනයේ තිව්‍ර තාවය, දින වරියාවේ ඇති දුර්වලතා, වාසස්ථානය හා ආහාර රටා පිළිබඳව විශේෂ සැලකීමක් ආයුර්වේද වෛද්‍යවරයා විසින් පෙන්වා දෙනු ලැබේ.

ශිරෝ වස්ති (Shiri Vasti) විශේෂ කලම් හිස් මුදුනේ තැබීම, විශේෂ නස්‍ය තුම සඳහා බෙහෙත් තෙල් යොදා ගැනීම ප්‍රතිකාර වලදී යෝග්‍ය වේ. සෙම බුරුල් කර පිට කරන, කන්ධ කාරි ස්නානය ඇතුළු ඉතුරු පියලි, නිප්පිලි, උක් හකුරු, යවාස, තර්කට සිංගි, සිරි තේක්කු තලාදුරු සහිත ක්ෂාය බීමට යහපති. පංච කර්ම කිරීම, බුද්ධ රාජ කල්කය සහිත ක්ෂාය, ගුලි කල්ක සහ බෙහෙත් තෙල් මගින් බාලයන්ගේ වුවද කප දෝශ නිට්ටාවටම සුව කල හැක.

සෑම් දසනායක - ආයුර්වේද වෛද්‍යය
පංච කර්ම විශේෂ - Kerala India
මාළේවන ශ්‍රී සදනිස්සර ආයුර්වේද වෛද්‍ය ශාස්ත්‍රී (ශ්‍රී ලංකා)
(BS Biology-USA) (GDip-Ayurvedic Panchakarma Therapy-India)

රන් බිජු දැමූ කිකිළිය මරා ගැනීම

මම ද්විත්ව පුරවැසියෙක් මි. ශ්‍රී ලාංකික සහ ඕස්ට්‍රේලියානු පුරවැසිකම් ද්වයය ම මට හිමි ය.

මා මෙන් ම, මගේ බිරිඳ ද, දියණිය ද ශ්‍රී ලාංකික සහ ඕස්ට්‍රේලියානු ද්විත්ව පුරවැසියෝ වෙති. ඕස්ට්‍රේලියාවේ ඉපදුණු මගේ පුතා ද, ඔහුගේ උපත ලංකාවේ ද ලියා පදිංචි කර ඇති නිසා, ඔහුට වසර දහ අට පිරෙන තෙක් ශ්‍රී ලාංකික සහ ඕස්ට්‍රේලියානු ද්විත්ව පුරවැසියෙකි.

ශ්‍රී ලංකාවෙන් ඕස්ට්‍රේලියාවට සංක්‍රමණය කළ අයෙකුට මේ ආකාරයට ද්විත්ව පුරවැසියෙක් වෙන්නට ලැබෙන්නේ, මුලින්ම, එයට ඕස්ට්‍රේලියානු නීතිය මගින් ඉඩ ලැබී ඇති නිසාය. එනම්, තම රටට සංක්‍රමණය කර පදිංචි වී සිට පසුව පුරවැසිකම ලබාගන්නා අයෙක්, තමන්ගේ මුල් පුරවැසිබව තව දුරටත් තබා ගැනීමට අදහස් කරයි නම් එයට ඕස්ට්‍රේලියානු නීතිය මගින් අවසර දී ඇත. ඇත්තටම, ඕස්ට්‍රේලියනුවෙකුට අවශ්‍ය නම් රටවල් කීපයක වුවද පුරවැසි බව තබා ගත හැක. ඒ සඳහා වෙනම ඕස්ට්‍රේලියවෙන් අවසර ඉල්ලීමට අවශ්‍ය නොවේ. අවසර අවශ්‍ය වන්නේ ඒ ඒ රටවල්වලිනි.

මේ අතර, ලංකාවේ නීතියට අනුව තම පුරවැසියෙක් වෙනත් රටකට සංක්‍රමණය කර එහි පුරවැසිකම ලබාගත් පසුත්, ඔහුට හෝ ඇයට ලංකාවේ පුරවැසිකම ද තවදුරටත් තබා ගන්නට අවශ්‍ය නම්, ඒ සඳහා පෙර අවසරයක් ලංකාවේ රජයෙන් ලබාගත යුතුය.

එනිසා, සරලව ද්විත්ව පුරවැසි අයැදුම හෙවත් ඩුවල් සිටිසන්ෂිප් ඇප්ලිකේෂන් නමින් හැඳින්වෙනත් මේ අයැදුම් කරන්නේ සහ අවසර ලබා දෙන්නේ හිවැරදිව කිව්හොත්, වෙනත් රටක පුරවැසිබව ලබාගත් පසු තව දුරටත් ශ්‍රී ලාංකික පුරවැසිබව තබාගැනීමට ය. මේ සඳහා මට ඇති අවසර පත්‍රය ව.ඛ.කු. විසින් තම රබර් සීල් එක තබා නිකුත් කරනු ලැබ ඇත. ඒ, ආගමන හා විමමන විෂයය බාර රාජ්‍ය ආරක්ෂක ඇමති ලෙස කළ අනුමැතියකි.

ඒ දිනවල මේ සඳහා අයැදුම් පත්‍ර ගාස්තුව වූයේ මුල් ඇයදුම්කරුට රුපියල් ලක්ෂයකි. එයට එක් කරන පවුලේ අනෙක් සාමාජිකයින් වෙනුවෙන් එක් අයෙකුට රුපියල් විසි පන්දහසක් ගෙවිය යුතු විය. මේ අනුව මම, මේ සඳහා රුපියල් 150,000 ක් ගෙවුයෙමි. එය එවකට විනිමය අනුපාතිකය අනුව ඕස්ට්‍රේලියානු ඩොලර් 3,500 ක් පමණ විය.

මෙතරම් මුදලක් ගෙවා ලබා ගත් ඒ සහතිකය නිකම්ම නිකං දුඹුරු කඩදාසියක මුද්‍රණය වූ එකක් පාංකඩයක් වැනි කොළ කෑල්ලක් පමණක් වීම නම් දුකට කරුණකි.

මා මෙන්ම අප දන්නා හඳුණන පවුල් කීපයක්ම ඒ අකාරයට අවශ්‍ය අවසරය මුලින් ශ්‍රී ලංකාවෙන් ලබාගෙන, ඉන් පසුව ඕස්ට්‍රේලියානු පුරවැසිබව ලබා ගන්න. ඒ දිනවල එතරම් මුදලක් වය කරමින් අප එලෙස කළේ අයි ද යන්න අමුතුවෙන් කිව යුතු නොවේ.

තමන් ඉපදුණු, හැදුණු, වැඩුණු, ඉගෙනගත්, වසර ගණනාවක් රැකියා කළ රට සමග ඇති ඒ පෙකෙණිවැල කපා දැමීමට සිත හදා ගැනීම, අප බොහෝ දෙනෙකුට ලේසි පහසු කටයුත්තක් නොවෙන නිසාවෙනි. ඒ බැඳීම සදාකාලිකවම පවත්වා ගැනීමට අවශ්‍ය නිසාවෙනි.

ශ්‍රී ලාංකිකයින්ට මේ අවසරය මුලින්ම ලබා දී ඇත්තේ වසර 1988 දී වන අතර එකල මේ සඳහා ගාස්තුව වී ඇත්තේ රුපියල් 5,000 ක් පමණි. පසුව ආර් ප්‍රේමදාස යුගයේ දී මෙය එක්වරම 2000% කින් වැඩිකර ඇත. එකල ඇමතියෙකු වූ ලලිත් අතුලත්මුදලි මේ වැඩිකිරීම හඳුන්වා ඇත්තේ ලරත්තරන් බිත්ර දැමූ කිකිළිය මැරීමේල කතාවටයි.

නමුත් පසු කලෙක චන්ද්‍රිකා රාජ්‍ය සමයේ දී සිදුවූයේ ද මේ අයැදුම් පත් ගාස්තුව තවත් දෙතුන් ගුණයකින් ඉහල යාමයි.

ඉන් පසුව, හේතුව කෙලින්ම නොදැක්වුවද, පසුගිය රජය ජාතිවාදී න්‍යාය පත්‍රයකට අනුව ක්‍රියාකරමින්, වෙනත් රටක පුරවැසිබව ලබාගත් පසු තව දුරටත් ශ්‍රී ලාංකික පුරවැසිබව තබා ගැනීමට අවසර දීම තාවකාලිකව අත් හිටුවන ලද අතර, ඒ අත්හිටවීම මේ වසරේ මුල දක්වා ම ක්‍රියාත්මක විය.

පසුගිය වසරේ අග භාගයේ සිටම, මේ තාවකාලික අත්හිටුවීම අවසන් කර ඇළුතින් නීති හදන්වා දෙන බවට විවිධ ප්‍රකාශ වටින් ගොඩින් කෙරුණ ද, එය ඇත්තටම ප්‍රකාශ කෙරුණේ මේ වසරේ මුල් සතියේ ය.

ඉන්පසු අද වෙන විට, යහපාලන මිනි බප්ටිටුව මගින් ඒ අයැදුම් පත්‍ර ගාස්තුව, එක පුද්ගලයෙකුට රුපියල් 500,000 ක් දක්වා වැඩි කර ඇත. මේ සමාන අයැදුම්පත සඳහා ඉන්දියාවේ ගාස්තුව ඉන්දියානු රුපියල් 15,000 ක් පමණි.

ලංකාවට ගොඩ බැසීමෙදී තමන් වෙසෙන රටේ ගමන් බලපත්‍රය වෙනුවට තමන් ගේ ශ්‍රී ලංකා ගමන් බලපත්‍රය පාවිච්චි කළහොත්, විස්කි බෝතල් එකහමාරක් වෙනුවට බෝතල් තුනක් ම තීරු බදු රහිතව මිළදී ගැනීමට හැකිවීම, ඒ සමගම තීරු බදු සාප්පුවකින් ඥාතියෙකුට කුමක් හෝ අවශ්‍ය විදුලි උපකරණයක් මිළට ගෙන සුළු මුදලක් ඉතිරි කර දීමට හැකිවීම වැනි සුළු වාසි අතහැරිය විට, වෙනත් රටක පුරවැසිබාවය ලබා දීමටම එහි පීවත් වීමට සිතා සිටින අයෙකුට ද්විත්ව පුරවැසියෙක් වීමෙන් ලැබෙන ලොකු ආර්ථික වාසියක් නැති තරම් ය.

එනිසා, මේ වැඩිකළ ගාස්තු නිසා මෙතෙක් කල් මේ අවසරය ලබා ගැනීමට අදහස් කරගෙන සිටි අයගෙන් කොටසක් දුර්මුඛ වී, එනිසා මේ සඳහා ඇති ඉල්ලුම අඩුවී ගොස්, මේ ගාස්තු මගින් ක්ෂණිකව ලබා ගත හැකි මුළු ආදායමද අස්ත්‍රමෙන්තුවලට වඩා අඩුවිය හැකි අතර, මා කලින් සඳහන් කළ රන් බිජු දැමූ කිකිළිය ගේ උපමාවේ මෙන් ද්විත්ව පුරවැසිබව ලබාගන්නා පිරිස අඩුවීමෙන් ශ්‍රී ලංකාවට දීර්ඝ කාලීනව පාඩු සිදුවීමටද ඉඩ ඇති බව මගේ අදහසයි.

රසිකොලොජිස්ට්
http://rasikalogy.blogspot.com.au